# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1637/24 - 2010 ජනවාරි 22 වැනි සිකුරාදා - 2010.01.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1)(iii) වගන්තිය සහ මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 07 දරන පළාත් පාලන ආයතන පරිපාලනය අධීක්ෂණය කිරීමේ ප්‍රඥප්තියේ 2(1)(iii) වගන්තිය යටතේ කරනු ලබන නියමය සහ ප්‍රාදේශීය සභා පනතේ 185 (5) (අ) වගන්තිය යටතේ කරනු ලබන නියමය

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1)(iii) වගන්තිය සහ මධ්‍යම පළාතේ පළාත් සභාවේ 1990 අංක 07 දරන පළාත් පාලන ආයතන පරිපාලනය අධීක්ෂණය කිරීමේ ප්‍රඥප්තියේ 2(1) (iii) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය සරත් ඒකනායක වන මම, මහනුවර දිස්ත්‍රික්කයේ උඩපළාත ප්‍රාදේශීය සභාව අත්හිට වූ දින සිට ක්‍රියාත්මක වන පරිදි විසුරුවා හරිමි.

තවද, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන ) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (5) (අ) වගන්තියෙන් මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව උඩපළාත ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමට සහ කාර්යයන් ඉටුකිරීම සඳහා විශේෂ කොමසාරිස්වරයෙකු ලෙස උඩගේ මුදියන්සේලාගේ අබේරත්න බණ්ඩා මහතා පත් කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2010 ජනවාරි මස 20 වැනි දින,
මහනුවර,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

02-156

1A - PG 001113 — 340 (2010/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.